

උපේක්ෂා
සිය ගුරුතුමිය
සමඟ

# උඩරට නැටුම්කලාව කැනඩාවට ගෙන ගිය අපේ නැටුම් ශිල්පිනිය රුක්මල් ගුණසේකර









**අපේකම සැමදා අගනේය. මවුබිමේ ජීවත් වුවද, මවුබිමේ පිට ජීවත් වුවද අපේකම අමතක කරන්නට බැරි ශ්‍රී ලාංකේය අපට එය හද පත්ලෙන්ම දැනෙන නිසා ය.**

මේ ගුරුතුමිය අපේ යැයි කටපුරා කිව හැකියි. ඇය අපටත් වඩා හොඳින් අපේකම දනී.

ඇය නමින් රුක්මල් ගුණසේකරයි.

කොළඹ සුජාතා විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලැබූ ඇය වැඩිදුර අධ්‍යාපනය සඳහා ඇමරිකාවේ වොෂිංටන් නගරයට ගියාය. එය ඇගේ කලා දිවියේ සුවිශේෂී ආරම්භයයි. මේ වන විට ඇය ශ්‍රී ජයනාගේ වැඩිමල් දියණී රත්නා යටතේ නැටුම් හදරා ඇගේ නැටුම් කණ්ඩායමේ සාමාජිකාවකද වී සිටියාය.

සිය නිසග හැකියාවට තැනක් වෙලාවක් අවශ්‍ය නැත. රුක්මල් සිතන්නටත් පෙර ඈ සොයා වාසනාව ළඟා වූවාය. ඈ ශ්‍රී ලංකාව නියෝජනය කළාය. ඒ හරහා දේශීය නැටුම් කලාව ලොව පුරා පතුරවන්නට මහත් වෙහෙසක් ගත්තාය. එය හිතුවාටත් වඩා සාර්ථක වීම ශ්‍රී ලංකාවට ලැබුණු භාග්‍යයකි.

"වොෂිංටනයේ ගත කළ වසර කිහිපය තුළදී අපේකම අගයන පිරිසකට දැනුම ලබාදීමට හැකිවීම ගැන අදටත් මා සතුටුවෙනවා" රුක්මල් සතුටින් කියන්නීය.

ඇගේ දක්ෂතාවයෙන් ඵල නෙලාගන්නට ඉඩකඩ ලැබුණේ ඇමරිකාවට පමණක් නොවේ. වොෂිංටන් ගමන කැනඩාව දක්වා දිගු විය. ඒ අනුව ඇය 1995 වසරේ කැනඩාවට පැමිණියාය.

විවිධ ජාතීන්ගෙන් පිරුණු කැනඩාවට උඩරට නැටුම් කලාව අමුත්තකි. ඒ අමුත්ත රුක්මල්ට ප්‍රශ්නයක් නොවූවාය. කැනඩා පුරවැසියන් අන්ද මන්ද කරමින් ඈ ඇගේ නිසග හැකියාව පෙන්වූවාය. කැනඩා රජයේ මුදලින් පියාසර ශිල්පාධිපති වැනි නැටුම් ක්ෂේත්‍රයේ ඉහළින් සිටින ගුරුවරයින් කැනඩාවට ගෙන්වන්නට තරම් ඈ කැනඩා රජයේ ඇස් ඇරවූවාය.

අද රුක්මල් ශ්‍රී ලාංකික දරුවන් පිරිසකගේ පමණක් නොව සුදු ජාතිකයින්ගේ දරුවනටද ගුරුවරියකව ශ්‍රී ලංකා නාමය කැනඩාව පුරා ප්‍රචලිත කරමින් මහගු සේවයක යෙදී සිටින්නීය.

ඈ පිළිබඳ මෙම කෙටි ලිපිය ලියන්නට පෙර මම අපේ රටේ උඩරට නැටුම් කලාව ජාත්‍යන්තර තලයට ගෙන ගිය ප්‍රවීණ නර්තනාචාර්ය ශ්‍රී ජයනා ශූරීන් සමඟ කතා කළෙමි.

"රුක්මල් අපේ සිසුවියක්. මට ඈ ගැන සන්තෝෂයක් ඇතිවුණේ නැටුම් කලාව වෙනුවෙන්ම ඈ ඇගේ ජීවිතය කැප කළ නිසයි. ඉතා උනන්දුවෙන් කැපවීමෙන් ඈ පිටරටකට වී ශ්‍රී ලංකා නාමයට කීර්තියක් අත්කර දෙනවා.

නැටුම් වලට කැමැති තවමත් මවුබිමේ ජීවත්වන බොහෝ තරුණියනට රුක්මල් ආදර්ශයක්. ඈ අපේ රටට සම්පතක්.

ඒ ශ්‍රී ජයනා ශූරීන් රුක්මල් ගුණසේකර නම් වූ නැටුම් ශිල්පිනිය දකින අයුරුයි. රුක්මල්ට දක්ෂ සිසුවියන් පිරිසක් සිටී. ඒ අතරින් උපේක්ෂා ප්‍රනාන්දුට හිමිවන්නේ සුවිශේෂී තැනකි.

උපේක්ෂාගේ පියා හෙන්රි ප්‍රනාන්දු සඳලංකාවේ උපන්නෙකි. මව නන්දනීය. ඈ ද සඳලංකාවේය. මීට වසර 18 කට පෙර මේ දෙදෙනා පදිංචිය සඳහා කැනඩාව තෝරා ගත්හ.

උපේක්ෂා ඔවුන්ගේ වැඩිමල් දියණියයි. උපේක්ෂා උපන්නේ. කැනඩාවේය. ඈට සිංහල පිළිබඳව වැඩි දැනුමක් නැත. නමුදු ඈ අපේකම කැපී පෙනෙන නැටුම් කලාවට බෙහෙවින්ම ආදරය කළාය. නැටුම් කලාව තම ජීවිතය බව කියමින් රුක්මල් ගුණසේකර ගුරුතුමියගේ අගැයුමට ලක් වී සිටින්නීය.

මට උඩරට නැටුම් කලාව පිළිබඳ එතරම් වැටහීමක් තිබුණේ නෑ. ඒත් මිස් නටන දිහා ආසාවෙන් බලා හිටියා. මටත් නොදැනීම මගේ හිත මේ නැටුම් කලාවට යොමුවුණා. තරුණියකගෙ සිතට මොන තරම් මානසික සුවයක් මේ නැටුම් කලාව හරහා ලැබෙනවාද යන්න අද මම හොඳහැටි වටහා ගෙන තිබෙනවා.

මම ලංකාවේ නැටුම් කලාවට පමණක් නොවේ ලංකාවටත් කැමැතියි. දෙපාරක් ලංකාවට ගියා. ඒ ගමන හරි විනෝදයි. ලංකාවේ පරිසරයට හරි කැමැතියි. කුඹුරු යායවල් මගේ හිතට සතුටක් ගෙන දුන්නා.

මගේ මිස්ගෙ ආසාව මා නැටුම් ශිල්පිනියක වෙනවා දකින්න.

දැන් මගේ ආසාවක් එයමයි. තව වසර දෙක තුනකින් ලංකාවට පැමිණ වෙස් බඳින්නයි අදහස. මා දැනට උසස් පෙළ හදාරමින් ඉන්නේ. විභාගයට සාර්ථකව මුහුණ දී ලංකාවට එන්නයි අදහස.

17 හැවිරිදි උපේක්ෂා කැඩුණු සිංහලෙන් කියන්නීය.

"මේ දරුවා තමයි දැන් මගෙ ජීවිතය ඈ කැනඩා පරිසරයේ ජීවත් වූවාට ඇගේ ළඟ සිංහලකම හරි අපූරුවට තිබෙනවා.

මෙහේ ජීවත්වන, මෙහේ උපන් දරුවනට අපේ සංස්කෘතියේ අංග පුරුදු පුහුණු කරන්නට ටිකක් අමාරුයි. ඒත් උපේක්ෂා කෙරෙන් එවැන්නක් මා දුටුවේ නෑ.ඈ දැන් අපේ රටේ නැටුම් ඉගෙන ගන්නා දරුවන් මෙන් ගුරු ගෞරවය ඉතා ඉහළින් තබාගෙන මේ නැටුම් කලාව දක්ෂ ලෙස හදාරනවා. ඇත්තටම එය ජයග්‍රහණයක්. අපේ පුරුදු අපේ සිරිත් විරිත් ශ්‍රී ලාංකික දරුවනට වඩා වැදගත්. වැදගත් පමණක් නොවේ එය ජිවිතයේ සාර්ථකත්වයටද බෙහෙවින් බලපානවා. උපේක්ෂාගේ ආදරණීය ගුරුතුමිය උපේක්ෂා දකින අයුරුයි ඒ.

"උපේක්ෂා වෙස් බැන්දෙත් පිටරටක ඉපදී එහි හැදී වැඩී අකුර කර වෙස් බඳින පළමු යුවතිය උපේක්ෂා දියණී වෙන්න පුළුවන්" රුක්මල් යළිත් කියන්නීය.

අප රැක ගත යුත්තේ අපේකමය.

අපේකම රකින්නට අප අපේ දරුවනට පුරුදු කළ යුතුය. උපේක්ෂා කැනඩාවේ උපන්නාව ඇගේ මවත් පියාත් ශ්‍රී ලාංකිකයින්ය.

මේ ආදරණීය අම්මාත්, තාත්තාත් පිටරට පුරවැසිභාවය ලැබ එහි පරිසරය හා නිරන්තරයෙන් ගැටෙන උපේක්ෂාට හරි අපූරුවට අපේකම කියාදී තිබීම ලක්මවගේ වාසනාවකි.

**සටහන - ගාමිණී සමරසිංහ**